# Abstract No 74

## සංස්කෘත නාට්‍යයන්හි සිංහල අනුවාද රසවින්දනය උදෙසා සකු කවිසමයේ දායකත්වය (ශාකුන්තලය, රත්නාවලිය හා මැටිකරත්තය නාට්‍යත්‍රය ඇසුරින්)

**එච්. ඒ. ගිහාන් මධුසංඛ**
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
gihansinhala@gmail.com

භරතමුනි නම් සංස්කෘත න්‍යායාචාර්යවරයා විසින් ක්‍රි. ව. 5 සියවසේ දී පමණ ප්‍රණීත නාට්‍යශාස්ත්‍රය, සංස්කෘත නාට්‍ය කලාව උදෙසා රීති පද්ධතියක් යොජනා කරයි. එබඳු කෘතියක් රචනා වීමෙන් ම පෙනී යන්නේ සංස්කෘත නාට්‍ය කලාව, නාට්‍ය සම්ප්‍රදායක් වශයෙන් ඒ වන විටත් ස්ථාපිත ව පැවති බව යි. විද්‍යමාන සංස්කෘත නාට්‍ය පිටපත් ඇසුරින් එහි ප්‍රභවය ක්‍රිස්තු වර්ෂයෙන් පළමු සියවසට පමණ අයත් කර දක්වෙයි. සංස්කෘත නාට්‍ය හා රස සංකල්පය අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින්නකි. එහි දී න්‍යායික සංකල්ප වේදිකා ගත කළ කතා පුවතක් ඇසුරින් ප්‍රායෝගික ව ප්‍රයුංජනය කිරීමක් සිදු විය. භාවයන් ඇසුරු කරමින් රස ප්‍රතීතියෙහිලා ප්‍රමුඛ පෙළේ දායකත්වයක් සැපයූ සංස්කෘත නාට්‍ය කෙරෙහි තත් කාලීන ප්‍රභූ ජන ජීවිතය ප්‍රබල බලපෑමක් සිදු කළේ ය. නාට්‍ය රචකයෝ ස්වකීය නිර්මාණ කාර්යය උදෙසා කවිසමයෙන් ආලෝකයක් ලැබූහ. පෙරදිග සාහිත්‍යයේ අද්භූත රස ජනනය කිරීමේ ව්‍යාපාරය වශයෙන් කවිසමය හැඳින්විය හැකි ය. එහි දි පියවි ලෝකයේ අවිද්‍යමාන සංකල්ප, විද්‍යමාන සේ දැක්වීම, විද්‍යමාන දේ අවිද්‍යමාන සේ දැක්වීම හා ඇතැම් දේ නියම කොට දැක්වීම සිදු විය. සංස්කෘත නාට්‍ය රචකයෝ මෙම කවිසමය පරිභාවිත කරමින් නාට්‍යකරණයේ නියැලුණහ. එමඟින් ස්වකීය නාට්‍යයෙහි කතා පුවතේ රස කුළු ගැන්වීම, නාට්‍යෝචිත අවස්ථා උත්කර්ෂයට නැංවීම, විකාශන උපක්‍රමයක් වශයෙන් හෝ ආකෘතික පරිසමාප්තියක් උදෙසා හෝ කවිසමයේ අනුග්‍රහය ලැබූහ. පියදාස නිශ්ශංක, සුචරිත ගම්ලත් වැනි භාෂාන්තර ඥානයෙන් හෙබි වියත් රසකාමීහු සංස්කෘත නාට්‍ය රැසක් සිංහලට අනුවර්තනය කළහ. එම අනුවාද නාට්‍ය පෙළ රස විඳීමේ දී අද්‍යතන සිංහල රසිකයින්ගේ රසවින්දනය උදෙසා සකු කවිසමය වටහා ගැනීමේ වැදගත්කම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. එහි දී කාලිදාසයන්ගේ ශාකුන්තලය, ශ්‍රී හර්ෂදේවයන්ගේ රත්නාවලිය හා ශුද්‍රකගේ මෘච්ඡකටිකා නම් කෘති අධ්‍යයන සීමාව වශයෙන් යොදා ගැනෙයි.

**ප්‍රමුඛ පදඃ** නාට්‍ය ශාස්ත්‍රය, සකු කවිසමය, අද්භූත රසය, අනුවාද නාට්‍ය, අද්‍යතන සිංහල රසිකයා